# රැකියා නියුක්තියේ ස්වාභාවය සහ පුරුෂයන්ගේ සෞඛ්‍ය ගැටලු: ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තය ඇසුරින්

ආර්.පී.පී.ජී.ඒ.එස්. විජේසිංහ - ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය

දේශීය වෙළඳපොළෙහි වැවිලි ආර්ථිකය සඳහා විශේෂ වටිනාකමක් පවතී. එම නිසා විශාල සේවා නියුක්තිකයන් පිරිසක් වැවිලි ආර්ථිකය වටා ඒකරාශී වී සිටී. වැවිලි ආර්ථිකයේ රබර් කර්මාන්තය සඳහා වැඩි වැදගත්කමක් ලබා දී ඇත. ඒ අනුව රබර් නිෂ්පාදනය ගත් විට කෘත්‍රිම රබර් නිෂ්පාදනය සහ ස්වාභාවික රබර් නිෂ්පාදනය ලෙස අංශ දෙකක් පවතී. එහිදී බොහෝ පර්යේෂණ සිදු කර තිබෙන්නේ කෘත්‍රිම රබර් නිෂ්පාදන කර්මාන්තය තුළ පුද්ගලයන්ට ඇති වන සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙනි. ස්වාභාවික රබර් නිෂ්පාදනය තුළ පුරුෂයන් කේන්ද්‍ර කර ගෙන ඔවුන්ට එල්ල වන සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණ විරලය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තය ආශ්‍රිතව සේවය කරන පුරුෂයන් මුහුණ දෙන සෞඛ්‍ය ගැටලු විමසීමයි. ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පාරඹේ වත්ත රබර් කර්මාන්ත ශාලාවේ සේවය කරන පුරුෂ සේවකයින්ගෙන් 125 දෙනෙකු ක්‍රමවත් නියැදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදි. මෙම අධ්‍යයනය මූලික ලෙස ප්‍රාථමික දත්ත පදනම් කර ගෙන සිදු කරන ලද අධ්‍යයනයක් විය. ප්‍රාථමික දත්ත එකතු කිරීමේ ප්‍රධාන ක්‍රමවේදය ලෙස සමීක්ෂකයා විසින් පුරවනු ලබන ප්‍රශ්නාවලි ක්‍රමවේදය උපයෝගී කර ගන්නා ලදි. මෙම අධ්‍යයනයෙන් ලබා ගත් ප්‍රතිඵලවලින් ප්‍රත්‍යක්ෂ වූයේ (74.4%)ක පිරිසක් රබර් කර්මාන්ත ශාලාව තුළ කිසියම් අනතුරකට භාජනය වී ඇති බවයි. ඉන් (36.8%)ක පිරිසක් කායික හෝ මානසික බලපෑමකට භාජනය වී ඇත. (17.6%)ක පිරිසක් කෘත්‍රිම අමුද්‍රව්‍ය ආශ්‍රිත අනතුරකට භාජනය වී ඇත. රැකියාවට පැමිණි පසු වැළඳුණු රෝග, රැකියාව නිසා ම වැළඳුණු රෝග බවට සේවකයන්ගෙන් (84.0%)ක ප්‍රමාණයක් ප්‍රකාශ කර ඇත. රැකියාවට පැමිණි පසු වැළඳුණු රෝග අතරින් (28.0%)ක ප්‍රමාණයක් සන්ධි ආශ්‍රිත රෝගය. රැකියාව නිසාම වැළඳුණු රෝග සඳහා රබර් කිරි කැපීමේ අංශය තුළ සේවය කරන පුද්ගලයන්ගෙන් (57%)ක ප්‍රමාණයක් ගොදුරු වී ඇත. ඒ අනුව රබර් කර්මාන්තය තුළ සේවය කරන බොහෝ දෙනෙකු බෝ නොවන රෝග සඳහා භාජනය වී ඇත. එබැවින් රබර් කර්මාන්තය ආශ්‍රිතව සේවය කරන පුරුෂයන්ගේ සෞඛ්‍ය තත්වය නඟා සිටුවීම සඳහා උපදේශන සේවා, වෛද්‍ය පරීක්ෂණ, පුද්ගලයන්ගේ සෞඛ්‍ය හැසිරීම නඟා සිටුවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් රාජ්‍ය මට්ටමින් ස්ථාපිත කිරීමත්, පෞද්ගලික සෞඛ්‍ය ආරක්ෂාව වැඩිදියුණු කර ගන්නා ආකාරය පිළිබඳවත් දැනුවත් කිරීම අවශ්‍ය වේ.

***ප්‍රමුඛ පද:*** *සේවා නියුක්තිකයන්, වැවිලි ආර්ථිකය, කෘත්‍රිම රබර් නිෂ්පාදනය, ස්වාභාවික රබර් නිෂ්පාදනය*